570

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

**ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන - 3 වන මට්ටම**

**2022/2023 අවසාන පරීක්ෂණය**

**EPU3338 - මුල් ළමාවිය මධ්‍යස්ථාන සහ ප්‍රාථමික පාසල් කළමනාකරණය කිරීම හා සැලසුම් කිරීම**

**කාලය - පැය දෙකයි. (02)**

---

**දිනය - 2024.02.17** **වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා**

---

01 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකට (03) **පමණක්** **පිළිතුරු සපයන්න.**

**<u>01 - වන කොටස</u>**

01. ප්‍රාථමික පාසලක කළමනාකරණ ක්‍රියාවලිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

02. "ප්‍රාථමික පාසල් ගුරුවරියක් විසින් තක්සේරු කිරීම සඳහා තක්සේරු කරණ වාර්තා පවත්වා ගෙන යායුතුය." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර තහවුරු කිරීමට කරුණු **පහක්** (05) ලබා දෙන්න.

03. පෙරපාසලක හෝ ප්‍රාථමික පාසලක දරුවන් තුළ කායික සංවර්ධනය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාථමික පාසල් විදුහල්පතිවරයෙකුගේ නායකත්ව ගුණාංග **පහක්** (05) සඳහන් කරන්න.

05. දිවාසුරකුම් මධ්‍යස්ථාන සහායිකාවකගේ වගකීම් **පහක්** (05) ලැයිස්තුගත කරන්න.

06. ප්‍රාථමික පාසලක එළිමහන් සෙල්ලම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම තුළින් ලබාගතහැකි වාසි **පහක්** (05) සඳහන් කරන්න.

07. නායකත්ව ශෛලීන් **තුනක්** (03) සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "SMART" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 5 x 8 = 40)

## 02- කොටස

09. (i.) ප්‍රාථමික පන්ති කාමරයක ඉගෙනුම් පරිසරය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු - 5)

(ii.) ඔබ ප්‍රාථමික පාසලක ඉගෙනුම් පරිසරය ඵලදායී ආකාරයට සංවිධානය කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 7)

(iii.) ප්‍රාථමික පාසල් ගුරුවරියක් ඵලදායී ආකාරයට ඉගෙනුම් පරිසරය සංවිධානය කරන විට දැරිය යුතු වගකීම් ලැයිස්තු ගත කරන්න. (ලකුණු - 8)

10. (i.) "නායකත්වය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු - 5)

(ii.) ප්‍රාථමික පාසල් විදුහල්පති වරයෙකුගේ වගකීම් ලැයිස්තු ගත කරන්න. (ලකුණු - 7)

(iii.) ප්‍රාථමික පාසලක් ඵලදායී ආකාරයට කළමනාකරණය කරන විට නායකත්ව ගුණාංග වල ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු - 8)

11. (i.) ප්‍රාථමික පාසලක මූල්‍ය සම්පත් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු - 5)

(ii.) ප්‍රාථමික පාසලක පන්ති කාමරයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය සම්පත් උපකාරී වන්නේ කෙසේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 7)

(iii.) "මූල්‍ය සම්පත් සොයාගැනීම ප්‍රාථමික පාසලක ගුරුවරියකගේ එක් වගකීමක් වේ."
ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු - 8)

12. (i.) සදාචාර සංවර්ධනයේ අවධි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 5)

(ii.) ප්‍රාථමික පාසලක සදාචාර සංවර්ධනය වැගත් වන්නේ ඇයි දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 7)

(iii.) ප්‍රාථමික පාසලක සදාචාර සංවර්ධනය සම්බන්ධයෙන් ගුරුවරියකගේ වගකීම් විභාග කරන්න. (ලකුණු - 8)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i.) මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය.

(ii.) ප්‍රාථමික පාසල්වල ප්‍රජා සම්පත් කළමනාකරණය.

(iii.) ප්‍රාථමික පන්ති කාමරයක තක්සේරුකරණ වාර්තා.

(iv.) විෂය සමගාමී ක්‍රියාකාරකම් වල වාසි.

(10 x 2 = ලකුණු - 20)

- හිමිකම් ඇවිරිණි. -